සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | 11 | 3 | 05. ජාත්‍යන්තර සම්බන්ධතා |




BIMSTEC

SAARC
South Asian Association for Regional Cooperation
Afghanistan Bangladesh Bhutan India Maldives Nepal Pakistan Sri Lanka


සැකසුම: වයි. පී. අයි. රුවන් කුමාරි

බප/හො/ඇස් මහින්ද මහා විද්‍යාලය, අලුබෝමුල්ල

# ජාත්‍යන්තර සම්බන්ධතා



- රංචු ලැදියාව නමැති සහජ මානව ලක්ෂණය පසක් කරමින් මිනිසාට හුදකලාව ජීවත් විය නොහැකි බව හේතුවෙන් කණ්ඩායම්ගත වීම, සංවිධානය වීම හරහා රටවල් අතර ද සම්බන්ධතා ගොඩනැගෙමින් පවතී.

- **ජාත්‍යන්තර සම්බන්ධතා යනු,**

රාජ්‍ය දෙකක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් අතර, රාජ්‍ය හා ජාත්‍යන්තර සංවිධාන අතර හෝ රාජ්‍ය හා පුද්ගලයන් අතර ඇතිවන්නා වූ ඕනෑම ආකාරයක සම්බන්ධතාය.

# ජාත්‍යන්තර සම්බන්ධතා වල වැදගත්කම්

- තම රාජ්‍යයට තනිව සපුරාගත නොහැකි යම් දෙයක් වේ නම් ඒවා සපුරා ගැනීමට හැකි වීම.
- දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සමාජීය ක්ෂේත්‍ර ඔස්සේ සම්බන්ධතා පුළුල් කරගත හැකිවීම.
- ප්‍රබල රාජ්‍ය වලින් ඇතිවන බලපෑම් වලින් ආරක්ෂා වීමට හැකි වීම.
- ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වලින් ඇතිවන බාධා මගහරවා ගැනීමට හැකිවීම.

# ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප දෙක



## 01. රාජ්‍ය උපාය සම්බන්ධතා

රාජ්‍ය උපාය සම්බන්ධතා යනු රාජ්‍ය හා රාජ්‍යයන් අතර ඇති කරගනු ලබන සාමකාමී සම්බන්ධතා හෙවත් තානාපතිවරු, මහකොමසාරිස්වරු හෝ රාජ්‍ය දූතයන් ආදී නිල මට්ටමේ පුද්ගලයින් හරහා ගොඩනගා ගනු ලබන රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාය.

උදාහරණ - ජාත්‍යන්තර සමුළු

කලාපීය සම්බන්ධතා

ද්වීපාර්ශවික හමුවීම්

## 02. යුද උපාය සම්බන්ධතා

යුද උපාය සම්බන්ධතා යනු යුදමය වශයෙන් රාජ්‍ය අතර ගොඩනගා ගන්නාවූ සම්බන්ධතා හෙවත් යම් රාජ්‍යයක් වෙත වෙනත් බාහිර රාජ්‍යයකින් යුදමය තර්ජනයක් පවතින අවස්ථාවලදී තම ආරක්ෂාව තහවුරු කරගැනීම වෙනුවෙන් ගොඩනගා ගන්නා සම්බන්ධතාය.

උදාහරණ - NATO සංවිධානය

WARSAW සංවිධානය

# ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනැගී ඇති විවිධ ක්ෂේත්‍ර

01 රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ඔස්සේ

02 සංස්කෘතික සාධක ඔස්සේ

03 තාක්ෂණික සම්බන්ධතා

04 සන්නිවේදනය

05 ප්‍රවාහනය

# ජාත්‍යන්තර සම්බන්ධතා ප්‍රසාරණය වීමෙහි ලා බලපෑ සාධක

01. සම්පත් විසංතුලනය වීම හෙවත් එක් එක් රටවල පවතින සම්පත්වල වෙනස්කම්
02. අවශ්‍යතා සියල්ලම තම රට තුළ නිපදවා ගත නොහැකි වීම
03. අතිරික්ත නිෂ්පාදන අලෙවි කර ගැනීම
04. ප්‍රවාහන හා සන්නිවේදනයේ දියුණුව
05. දියුණු තාක්ෂණය ලබා ගැනීමේ අවශ්‍යතාවය
06. හදිසි ආපදා හා වෙනත් විපත් අවස්ථාවලදී සහය ලබාගැනීම
07. දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සමාජීය සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීම

# ජාත්‍යන්තර සම්බන්ධතා වල වත්මන් ස්වරූපයේ විශේෂත්වය

- ප්‍රබල රාජ්‍ය විසින් දුබල රාජ්‍ය වෙත බලපෑම් එල්ල කිරීම

## එවැනි බලපෑම් එල්ල කරනු බලන ක්ෂේත්‍රයන්

- රටවල් අතර වෙළඳාම
- ණය හා ආධාර දීම
- ආර්ථික සංවර්ධනය
- ආරක්ෂක ක්ෂේත්‍රය
- රැකියා සැපයීම

# ජාත්‍යන්තර සංවිධාන උප විශේෂයක් ලෙස කලාපීය සංවිධාන

- කලාපීය සංවිධාන යනු, ප්‍රාදේශීය මට්ටමින් භූගෝලීය කලාප පදනම් කරගෙන ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සංවිධාන උප විශේෂයකි.

<u>කලාපීය සංවිධාන</u>

- සාර්ක් සංවිධානය
- ආසියාන් සංවිධානය
- කොළඹ ක්‍රමය
- බිම්ස්ටෙක් සංවිධානය

# කලාපීය සංවිධාන බිහිවීමේ ප්‍රධාන අරමුණු දෙකකි.

## 01. යුදමය අරමුණු පදනම් කරගත් කලාපීය සංවිධාන

උදාහරණ - බටහිර යුරෝපා රටවල සාමූහික ආරක්ෂාව උදෙසා පිහිටුවා ගත් - **නේටෝ සංවිධානය**

නැගෙනහිර යුරෝපා රටවල සාමූහික ආරක්ෂාව උදෙසා පිහිටුවාගත් - **වර්සෝ සංවිධානය**

## 02. ආර්ථික අරමුණු පදනම් කරගත් කලාපීය සංවිධාන

**යුරෝපා ආර්ථික ප්‍රජාව**

**යුරෝපා හවුල**

**ලතින් ඇමරිකානු නිදහස් වෙළඳ සංගමය**

**ආසියාන් සංවිධානය**

**ඔපෙක් සංවිධානය**

**සාර්ක් සංවිධානය**

# කලාපීය සංවිධානයක් ලෙස සාර්ක් සංවිධානය

සාර්ක් සංවිධානය යනු, දකුණු ආසියාතික කලාපයට අයත් රටවල් එක්ව පිහිටුවාගත් සංවිධානයයි.

- ආරම්භය - 1985 දෙසැම්බර් 08 බංග්ලාදේශයේ ඩකා අග නුවර
- සාර්ක් මහ ලේකම් කාර්යාලය - නේපාලයේ කත්මණ්ඩු නුවර පිහිටා ඇත

# සාර්ක් සංවිධානයේ අරමුණු

- තම කලාපයට අයත් ජනතාවගේ ශුභසාධනය හා ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම
- කලාපීය සමාජ, සංස්කෘතික සංවර්ධනය වේගවත් කිරීම
- කලාපීය ජනතාව අතර සාමූහික ආත්ම විශ්වාසය වැඩි කිරීම
- වෙනත් රටවල් සමග සහයෝගීතාවය වර්ධනය කිරීම
- පොදු වැදගත්කමකින් යුත් කරුණු සම්බන්ධව ජාත්‍යන්තර සමුළු වලදී සහයෝගීතාවෙන් කටයුතු කිරීම

# සාර්ක් සංවිධානයට අයත් රටවල් අටකි.



- ඉන්දියාව
- පාකිස්ථානය
- බංග්ලාදේශය
- නේපාලය
- භූතානය
- මාලදිවයින
- ශ්‍රී ලංකාව
- ඇෆ්ගනිස්ථානය



# සාර්ක් සංවිධානයේ සාමාජික රටවල් අතර ඇතිකරගෙන තිබෙන වැදගත් ගිවිසුම් දෙක

- **SAPTA** - දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම
- **SAFTA** - දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම

SAPTA ගිවිසුමේ අරමුණු

01 කලාපීය වෙළඳාම දියුණු කිරීම
02 සම්පත් කාර්යක්ෂමව යෙදවීම
03 තීරුබදු සහන ලබාදීම
04 දකුණු ආසියාවට සීමා වන වරණාත්මක වෙළඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම

SAFTA ගිවිසුමේ අරමුණු

01 කලාපීය රටවල් අතර නිදහස් වෙළඳ කලාපයක් ඇති කිරීම
02 කලාපීය රටවල ආර්ථික සහයෝගීතාව තර කිරීම
03 කලාපීය රටවල නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම
04 ශ්‍රම වෙළඳපොළ පුළුල් කිරීම
05 දේශීය ආර්ථිකය වර්ධනය වේගවත් කිරීම
06 තරගකාරීත්වය තුළින් ඉහළ මට්ටමේ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම

# සාර්ක් සංවිධානය සමග සම්බන්ධතා පවත්වන වෙනත් සංවිධාන



- උන්ක්ටාඩ් සංවිධානය
- යුනිසෙෆ් සංවිධානය
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
- කොළඹ ක්‍රමය

# ආසියාන් සංවිධානය




- ආරම්භය - 1967
- මූලස්ථානය - ඉන්දුනීසියාවේ ජාකර්තා නුවර
- සාමාජික රටවල් - ඉන්දුනීසියාව, සිංගප්පූරුව, තායිලන්තය, පිලිපීනය, මැලේසියාව, වියට්නාමය, බෲනායි, මියන්මාරය, ලාඕසය, කාම්බෝජය
- පරමාර්ථ - සහයෝගීතාව මත ඒකාබද්ධ ආර්ථික ක්‍රමයක් සාමාජික රටවල ක්‍රියාත්මක කිරීම.
- සමාජික රටවල ජන ජීවිතය උසස් කිරීම හා සන්නිවේදන මාර්ග දියුණු කිරීම
- කෘෂි හා කාර්මික ක්ෂේත්‍ර වඩාත් ඵලදායී කිරීම
- රටවල් අතර සහයෝගීතාව මත පර්යේෂණාත්මක අංශ දියුණු කිරීම
- සාමාජික රටවල වෙළඳ කටයුතු දියුණු කරමින් ජාත්‍යන්තර වානිජ කටයුතු වලදී මතුවන ප්‍රශ්න හැදෑරීමේ මාර්ග දියුණු කිරීම

# කොළඹ ක්‍රමය

- දකුණු හා අග්නිදිග ආසියාතික රටවල ආර්ථික හා සමාජීය අභිවෘද්ධිය සඳහා ඇති කර ගන්නා ලද සාමූහික සැලැස්ම කොළඹ ක්‍රමයයි.
- ආරම්භය - 1950
- මූලිකත්වය - ශ්‍රී ලංකාවේ එවක මුදල් ඇමති ජේ. ආර්. ජයවර්ධන සහ ඕස්ට්‍රේලියානු නියෝජිත සර් පර්සි ස්පෙන්ඩර්
- ආරම්භක රටවල් ගණන - 07 යි
- වත්මන් රටවල් - 27
- ලංකාවට සිදුවූ සේවාවන් - යන්ත්‍ර සූත්‍ර, වාහන, දුම්රිය එන්ජින්, කෘෂි උපකරණ, ධීවර ආම්පන්න, අධ්‍යාපන උපකරණ, කාර්මික ශිල්ප ඥානය, විශේෂඥයින් පුහුණු කිරීම, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම

# බිම්ස්ටෙක් සංවිධානය

- බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල සංවිධානය
- ආරම්භය - 1988
- මූලස්ථානය - බංග්ලාදේශය ඩකා නුවර
- අරමුණ - සාමාජික රටවල ඒකාබද්ධ ආර්ථික සහයෝගීතාව හා තාක්ෂණික දැනුම හුවමාරුව
- සාමාජික රටවල් -

| | |
|---|---|
| බංග්ලාදේශය | ඉන්දියාව |
| ශ්‍රී ලංකාව | මියන්මාරය |
| තායිලන්තය | නේපාලය |
| භූතානය | |

# ජාත්‍යන්තර සංවිධාන

- රටවල් කිහිපයක් ඒකරාශී වී තම පොදු අවශ්‍යතා සපුරාගැනීම වෙනුවෙන් සම්මුතියක් හරහා එකගතා ගොඩනගා ගැනීම ජාත්‍යන්තර සංවිධානයයි.

- ප්‍රධාන ජාත්‍යන්තර සංවිධාන දෙක

  01. **එක්සත් ජාතීන්ගේ සංවිධානය**

  02. **පොදු රාජ්‍ය මණ්ඩලය**

# එක්සත් ජාතීන්ගේ සංවිධානය

දෙවන ලෝක යුද්ධය අවසන් වීමත් සමග නැවත එවැනි ලෝක යුද්ධයක් ඇති වීම වැළැක්වීම සඳහා 1945 දී රටවල් 50 ක සහභාගීත්වයෙන් පිහිටුවාගන්නා ලද සංවිධානයයි.

## එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු

- ලෝක සාමය හා අරක්ෂාව පවත්වාගෙන යාම
- ජාතීන් අතර සබඳතා වර්ධනය කිරීම
- මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- රටවල් අතර ගැටළු නිරාකරණය කිරීමට සහය වීම
- පොදු අරමුණු සම්බන්ධීකරණය කොට මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම

# එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය

ප්‍රධාන කොටස් 06 කි.

01 මහා මණ්ඩලය

02 ආරක්ෂක මණ්ඩලය

03 ආර්ථික හා සමාජ මණ්ඩලය

04 භාරකාර මණ්ඩලය

05 ජාත්‍යන්තර අධිකරණය

06 ලේකම් කාර්යාලය

# මහා මණ්ඩලය

- එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජිකයින් මහා මණ්ඩලයට අයත් වේ.
- සෑම සාමාජිකයෙකුටම එක් ඡන්දයක් බැගින් හිමි වේ.
- වර්ෂයකට වරක් රැස්වන අතර වැඩිදෙනාගේ ඉල්ලීම මත විශේෂ රැස්වීම් පැවැත්විය හැක.
- බලතල හා කාර්යයන් රැසක් පැවරී ඇත.

# ආරක්ෂක මණ්ඩලය

- මුළු සමාජික රටවල් ගණන 15 කි.
- ස්ථාවර සමාජික රටවල් 05 කි.

  චීනය, ඇමෙරිකාව, බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව

- වසර දෙකක කාලයක් සඳහා ස්ථාවර නොවන සාමාජිකයින් 10 ක් පත් කරනු ලබයි.
- සියලු සාමාජිකයින්ගෙන් 09 දෙනෙකුගේ එකගතාවයකින් තීරණ ගනුලබයි.
- තීරණ ගැනීමේ නිශේධ බලය හිමි වන්නේ ස්ථාවර සමාජිකයන්ට පමණි.
- බලතල හා කාර්යයන් රැසක් පවතී.

# එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතන

- ආහාර හා කෘෂිකර්ම සංවිධානය
- අන්තර්ජාතික කම්කරු සංවිධානය
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
- එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
- එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය
- ප්‍රතිසංස්කරණ හා සංවර්ධන පිළිබඳ අන්තර්ජාතික බැංකුව (ලෝක බැංකුව)
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල
- ලෝක ආහාර වැඩසටහන
- ලෝක සෞඛ්‍ය සංවිධානය
- සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය

# පොදු රාජ්‍ය මණ්ඩලය

- දෙවන ලෝක යුද්ධයේ අවසන් කාලය තුළ නිදහස ලැබූ යටත් විජිත රටවල් එක්ව 1944 දී පිහිටුවා ගන්නා ලද සංවිධානයයි.
- අරමුණු - මානව සංහතියේ ආරක්ෂාව හා අභිවෘද්ධිය සඳහා ඉවහල් වන අන්තර්ජාතික සාමය හා ස්ථාවර භාවය නගා සිටුවීම
- ජාති ආගම් වර්ග බේද නොතකා සියලු පුරවැසියන්ගේ පුද්ගල නිදහස හා අයිතිවාසිකම් වර්ධනය කිරීම
- තමන් ජීවත් වන සමාජය සකස් කර ගැනීම පිණිස ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන කටයුතු වල යෙදීම සඳහා ඇති අයිතිය සුරක්ෂිත කිරීම
- දිළිඳුකම නූගත්කම හා ලෙඩරෝග තුරන් කිරීම සඳහා කටයුතු කිරීම
- යුද්ධ වලට හේතු වන තත්ත්වයන් ඉවත් කොට ආරක්ෂාව වැඩිදියුණු කිරීම
- ජාතිභේද වාදය හා යටත්විජිත වාදය හෙළා දකිමින් මිනිසාගේ අභිමානය හා සමානාත්මතාවය වර්ධනය කිරීම

# ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ආකාර

- තානාපති සේවය
- ජාත්‍යන්තර වෙළඳාම
- යුද්ධය
- විදේශ ආධාර

# තානාපති සේවය

- රාජ්‍ය අතර සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන යනු ලබන ප්‍රධාන මාධ්‍යයයි
- පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල තානාපතිවරු මහ කොමසාරිස් යන විශේෂ නමකින් හැදින්වේ

## තානාපතිවරුන්ගේ කාර්ය භාරය

- තම රටේ විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම
- රට වැසියන්ගේ අභිලාෂ ආරක්ෂා කිරීම
- තම රට මගින් දැනුම් දෙන වැදගත් පණිවිඩ ලබා දීම
- තම රටේ ප්‍රතිපත්ති අවබෝධ කර දීම
- තම රට පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ඇති කිරීම
- රාජ්‍ය අතර මිත්‍රත්වය වැඩි දියුණු කිරීම
- දේශපාලන සමාජ ආර්ථික හා බුද්ධිමය සම්බන්ධතා වර්ධනය කිරීම
- තම රට නියෝජනය කිරීම මෙන්ම තම රටේ රාජ්‍ය නායකයා නියෝජනය කිරීම

# ජාත්‍යන්තර වෙළදාම

- ප්‍රධාන කොටස් දෙකකි

1. ද්වීපාර්ශ්වික වෙළදාම
2. බහුපාර්ශ්වික වෙළදාම

ජාත්‍යන්තර වෙළදාම තුළ භාවිත වන ප්‍රබල මුදල් වර්ග

- ඇමරිකානු ඩොලර්
- ස්ටර්ලින් පවුම්
- යූරෝ
- ජපන් යෙන්

# විදේශ වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන

- යුරෝපා පොදු වෙළඳ හවුල
- උන්ක්ටාඩ් සංවිධානය
- ගැට් සංවිධානය
- ජාත්‍යන්තර මූල්‍ය සංවිධානය

# විදේශ ආධාර

- <u>විදේශ ආධාර සපයනු ලබන ප්‍රධාන ආකාර තුනකි</u>

1. පරිත්‍යාග - මුදල් / මුදල් නොවන/ ගොඩනැගිලි හා සේවා
2. ණය - පොලී සහිත / පොලී රහිත /දිගු කාලීන /කෙටි කාලීන
3. භාණ්ඩ හා සේවා

## විදේශ ආධාර සපයන රටවල්

1. ඇමරිකාව
2. එංගලන්තය
3. ජපානය
4. ඉන්දියාව

## විදේශ ආධාර සපයන සංවිධාන

1. ලෝක බැංකුව
2. ආසියානු සංවර්ධන බැංකුව
3. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

# ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩ නගා ගැනීමෙන් අත් වන ප්‍රතිඵල



- ජාත්‍යන්තර සුහදතාව වර්ධනය වේ
- නව රැකියා අවස්ථා උදා වීම
- හදිසි අවස්ථාවලදී අන්‍යෝන්‍ය ආධාර උපකාර ලැබීම
- නව තාක්ෂණික දැනුම හුවමාරු කර ගත හැකි වීම
- සංවර්ධන කටයුතු වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ලැබීම

**සවියෙන් පෙරට අපි එකට**

***e*- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | 11 | 3 | 05. ජාත්‍යන්තර සම්බන්ධතා - ඇගයීම |

**සැකසුම** **වයි. පී. අයි. රුවන් කුමාරි**
**බප/හො/ඇස් මහින්ද මහා විද්‍යාලය, අලුබෝමුල්ල**

1. I. ජාත්‍යන්තර සබඳතා යන්න පහදන්න
   II. ජාත්‍යන්තර සබඳතාවල වැදගත්කම් තුනක් ලියන්න.
   III. ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප දෙකක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

2. I. ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමෙහිලා බලපෑ සාධක දෙකක් ලියන්න.
   II. ජාත්‍යන්තර සබඳතා ඔස්සේ බලවත් රාජ්‍යයන් බලපෑම් එල්ල කරන ලද ක්ෂේත්‍ර තුනක් ලියන්න.
   III. ජාත්‍යන්තර වෙළඳාම හරහා ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල කරනු ලබන ක්ෂේත්‍ර දෙකක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න.

3. I. සාර්ක් සංවිධානයට අයත් රටවල් ගණන නම්කොට අළුතින් එක් වූ රට නම් කරන්න.
   II. සාර්ක් සංවිධානයේ අරමුණු තුනක් ලියන්න.
   III. සාර්ක් සාමාජික රටවල් අතර ඇති කරගෙන ඇති වෙළෙඳ ගිවිසුම් දෙකක් සඳහන් කොට ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න.

4. I. එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහයට අයත් ප්‍රධාන කොටස් දෙකක් නම් කරන්න.
   II. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ස්ථිර සාමාජිකත්වය ඇති රටවල් තුනක් නම් කරන්න.
   III. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් අනුබද්ධ ආයතන දෙකක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

5. I. ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රධාන ආකාර දෙකක් සඳහන් කරන්න.
   II. ජාත්‍යන්තර වෙළඳාම තුළ භාවිතාවන ප්‍රබල මුදල් වර්ග තුනක් නම් කරන්න.
   III. ශ්‍රී ලංකාවට විදේශ ආධාර සපයනු ලබන සංවිධාන දෙකක් ලියා ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | 11 | 3 | 05. ජාත්‍යන්තර සම්බන්ධතා - පිළිතුරු |

**සැකසුම  වයි. පී. අයි. රුවන් කුමාරි**
**බප/හො/ඇස් මහින්ද මහා විද්‍යාලය, අලුබෝමුල්ල**

1. I. ජාතීන් අතර පවත්නා වූ සියළුම ආකාරයේ සබඳතාවයන්ය

 II. * තම රාජ්‍යයට තනිව සපුරා ගත නොහැකි යම් දෙයක් වේ නම් ඒවා සපුරා ගැනීම
 * දේශපාලන, සංස්කෘතික, සාමාජීය ක්ෂේත්‍ර ඔස්සේ සබඳතා පුළුල් කරගත හැකි වීම
 * ප්‍රබල රාජ්‍ය මගින් ඇතිකරන බලපෑම් වලින් ආරක්ෂා වීම
 * ආරක්ෂාවාදී ප්‍රතිපත්ති වලින් ඇතිවන බාධා මග හරවා ගැනීම

 III. # රාජ්‍ය උපාය සබඳතා
 # යුධ උපාය සම්බන්ධතා
 *** විස්තර කිරීම සඳහා 11 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය පෙළපොතේ පිටු 124-125 අධ්‍යයනය කරන්න

2. I. * සම්පත් විසංතුලනය හෙවත් එක් එක් රටවල පවතින සම්පත්වල වෙනස්කම්
 * අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම
 * අතිරික්ත නිෂ්පාදන අලෙවි කරගැනීම
 * ප්‍රවාහන සහ සන්නිවේදන දියුණුව
 * දියුණු තාක්ෂණය ලබා ගැනීමේ අවශ්‍යතාවය

 II. * අන්තර්ජාතික වෙළඳාම
 * ණය හා ආධාර දීම
 * ආර්ථික සංවර්ධනය
 * ආරක්ෂක ක්ෂේත්‍රය
 * රැකියා සැපයීම

 III. * ණය හා ආධාර
 * ආර්ථික ක්ෂේත්‍රය
 * ජාතික ආරක්ෂාව
 * රැකියා සැපයීම
 ** විස්තර කිරීම සඳහා 11 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය පෙළපොතේ පිටු 128-129 අධ්‍යයනය කරන්න

3. I. 8කි. ඇෆ්ගනිස්ථානය

II. *කලාපයේ ජනතාව අතර සාමූහික ආත්ම විශ්වාසය වැඩිදියුණු කිරීම
* කලාපීය ආර්ථික, සමාජ හා සංස්කෘතික සංවර්ධනය වේගවත් කිරීම
* දකුණු ආසියානු කලාපයට අයත් ජනතාවගේ සුබ සාධනය හා ජීවන තත්වය වැඩි දියුණු කිරීම
* සියළුම පුරවැසියන්ට ගෞරවනීය ලෙස ජීවත්වීමට හා හැකියාවන් වටහා ගැනීමට ඉඩ සැලසීම
* වෙනත් රටවල් සමග සහයෝගීතාවය වර්ධනය කිරීම

III. දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම (සප්තා- SAPTA)
දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම ( සෆ්තා- SAFTA)
** විස්තර කිරීම සඳහා 11 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය පෙළපොතේ පිටු 134-135 අධ්‍යයනය කරන්න

4. I. * මහාමණ්ඩලය
* ආරක්ෂක මණ්ඩලය
* ආර්ථික හා සමාජ මණ්ඩලය
* භාරකාර මණ්ඩලය
* ජාත්‍යන්තර මණ්ඩලය
* ලේකම් කාර්යාලය

II. චීනය, ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, සෝවියට් රුසියාව

III. අන්තර්ජාතික කම්කරු සංවිධානය
අන්තර්ජාතික මූල්‍ය අරමුදල
එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල
එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය
ආහාර හා කෘෂි කර්ම සංවිධානය
ලෝක සෞඛ්‍ය සංවිධානය
***11 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය පෙළපොතේ පිටු 143-144 අධ්‍යයනය කර කෙටි හැඳින්වීමක් කරන්න.

5. I. ද්විපාර්ශවික වෙළෙඳාම, බහුපාර්ශවික වෙළෙඳාම
II. ඇමරිකානු ඩොලර්, ස්ටර්ලින් පවුම්, යුරෝ, ජපන් යෙන්
III. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
** විස්තර කිරීම සඳහා 11 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය පෙළපොතේ පිටු 144 අධ්‍යයනය කරන්න